අ.පො.ස. උසස් පෙළ

# ගිණුම්කරණය I

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය - 2022**

**ගිණුම්කරණය I** **කාලය: පැය දෙකයි**

විභාග අංකය :....................................

උපදෙස්:

❖ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න. අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

1. ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වඩා හොඳින් විස්තර කරනු ලබන ප්‍රකාශය වනුයේ,
   (1). මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා ගනුදෙනු වාර්තා කිරීම
   (2). කළමනාකරුවන්ගේ භාවිතය සඳහා තොරතුරු සන්නිවේදනය
   (3). ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම
   (4). මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ගනුදෙනු සටහන් කිරීම
   (5). ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම (......)

- අංක **2 , 3 ,4** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.
  කුංකුම විසින් 2021.01.01 දින තොග වෙළඳසලක් ආරම්භ කරන ලදි. ව්‍යාපාරය පිරිවැයට 25%ක ලාභ ප්‍රතිශතයක් මත භාණ්ඩ විකුණනු ලබන අතර VAT සඳහා ලියාපදිංචි ය. (VAT 8% කි.) ගැනුම් සඳහා VAT අදාළ නැත)

| **ගනුදෙනුව** | **වටිනාකම (රු 000)** |
|---|---|
| 1. කුංකුම ප්‍රාග්ධනය වශයෙන් ව්‍යාපාරයට මුදල් යෙදවීම | 600 |
| 2. තොග ණයට ගැනීම | 264 |
| 3. තොග ණයට විකිණීම | 324 |
| 4. දෝෂ සහිත බැවින් ණයට ගත් තොගවලින් කොටසක් ආපසු යැවීම | 108 |
| 5. සේවක වැටුප් ගෙවීම | 100 |

2. ඉහත ගනුදෙනු අංක **1, 3, 4** හි ශුද්ධ බලපෑම නිරූපණය කරනු ලබන ගිණුම්කරණ සමීකරණය කුමක්ද?

| | **වත්කම් (රු 000) =** | **හිමිකම් (රු 000) +** | **වගකීම් (රු 000)** |
|---|---|---|---|
| (1). | 576 | 660 | (84) |
| (2). | +584 | 668 | ( 84) |
| (3). | 584 | 660 | ( 84) |
| (4). | 824 | +660 | +24 |
| (5). | 824 | +668 | (108) |

(......)

3. ඉහත ගනුදෙනු අංක **1, 2, 4** සටහන් කිරීමට යොදා ගනු ලබන මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙළින්,

(1). ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය, හරපත

(2). ජ'නල් වවුචරය, ඉන්වොයිසිය, බැරපත

(3). ලදුපත, ඉන්වොසිය, හරපත

(4). ලදුපත, ඉන්වොයිසිය, බැරපත

(5). වවුචරය, ඉන්වොයිසිය, හරපත (......)

4. මෙම ව්‍යාපාරය ණයගැති පාලන ගිණුමක් පවත්වා ගෙන යන්නේ නම් ඉහත ගනුදෙනු **අංක 3** සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

| | | | **හර (රු 000)** | **බැර (රු 000)** |
|---|---|---|---|---|
| (1). | ණයගැති පාලන ගිණුම | හර | 324 | |
| | විකුණුම් ගිණුම | | | 324 |
| (2). | ණයගැති පාලන ගිණුම | හර | 324 | |
| | විකුණුම් ගිණුම | | | 300 |
| | VAT බදු ගිණුම | | | 24 |
| (3). | ණයගැති පාලන ගිණුම | හර | 300 | |
| | VAT වියදම් ගිණුම | හර | 24 | |
| | විකුණුම් ගිණුම | | | 324 |
| (4). | ණයගැති පාලන ගිණුම | හර | 300 | |
| | විකුණුම් ගිණුම | | | 300 |
| (5). | ණයගැති පාලන ගිණුම | හර | 300 | |
| | VAT වියදම් | හර | 24 | |
| | විකුණුම් ගිණුම | | | 300 |
| | VAT පාලන ගිණුම | | | 24 |

(......)

5. 2021.01.01 දින මුදලින් රු 800,000 ක් ආයෝජනය කරමින් සිතුම් විසින් ලිපිද්‍රව්‍ය විකිණීමේ නිරත ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර 2021 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු සිදු විය.

2021.01.01 සනුක වෙළඳුන්ගෙන් රු 80 000ක් වටිනා ලිපිද්‍රව්‍ය ණයට ගන්නා ලදි.

2021.01.11 රු 40 000ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු 80 000 කට සුපිපිට ණයට විකුණන ලදි.

2021.01.18 ඉන් විකුණුම් මිල 40 000ක් වූ ලිපිද්‍රව්‍ය සුපිපි විසින් ආපසු හරවා එවන ලදි.

2021.01.25 රු 5 000ක වට්ටමකට යටත් ව සනුක වෙළඳුන්ට ගෙවිය යුතු මුදල පියවන ලදි.

සිතුම්ගේ ව්‍යාපාරයේ **2021.01.11 සිට 2021.01.25** දක්වා සිදු වූ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කළ මූලික සටහන් පොත් අනුපිළිවෙළින්,

(1). ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය

(2). විකුණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය

(3). විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය

(4). විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය

(5). ගැනුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය (......)

6. රු. 4,000ක් ව පැවැති සුළු මුදල් අග්‍රිමය අප්‍රේල් සිට රු. 2,000 කින් වැඩි කර ඇත. 2021 මාර්තු මාසය ආරම්භයේ සුළු මුදල් භාරකරු අත ඉතිරි රු. 1,600 කි. මාර්තු සහ අප්‍රේල් මාස දෙකේ සුළු වියදම් එකතුව රු 6,000කි. මාර්තු මාසයට වඩා අප්‍රේල් මාසයේ සුළු වියදම් 50% කින් වැඩි වී ඇත. අප්‍රේල් සුළු මුදල් ගෙවීම් වන්නේ.

(1). රු 1600 කි (2). රු 2400 කි (3). රු 6000 කි

(4). රු 4000 කි (5). රු 3600 කි (......)

7. සීමිත මධු පොදු සමාගමේ 2022.03.31 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 25,000ක අයිරාවකි. නමුත් එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය සමඟ මෙය එකඟ නොවීය. වෙනසට හේතු පහත විය.

- මාර්තු මාසය තුළ නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් කළ චෙක්පත්වල වටිනාකම රු. 165,000ක් වූ අතර මෙයින් රු. 7,500ක් පෙබරවාරි නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සඳහා ගෙවීම් වේ.
- මාර්තු මාසයේ නිකුත් කළ සියලු චෙක්පත්වල වටිනාකම රු. 175,000 කි.
- මාර්තු මාසයේ තැන්පත් කළ චෙක්පත්වල වටිනාකම රු. 225,000 කි. නමුත් එයින් උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම රු 53 000 කි.
- මාර්තු මාසයේ ස්ථාවර නියෝගවල මුළු වටිනාකම රු 65,000 කි.

2022.03.31 දිනට ගැළපීම් කිරීමට පෙර හා ගැළපීම් කිරීමෙන් පසු මුදල් ශේෂය වන්නේ,

| | ගැළපීම් කිරීමට පෙර | ගැළපීම් කිරීමෙන් පසු |
|---|---|---|
| (1). | 33 000 | 18 000 |
| (2). | 75 500 | 10 500 |
| (3). | 33 000 | 10 500 |
| (4). | 25 500 | 60 500 |
| (5). | (75 500) | 60 500 |

(......)

8. 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මුදලින් ලද ආයෝජන ආදායම රු. 6,500ක් ආයෝජන ආදායම් ගිණුමට රු. 5,600 ක් ලෙස හර කර ඇත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1). ආයෝජන ආදායම් ගිණුම හර 900
අවිනිශ්චිත ගිණුම බැර 900

(2). මුදල් ගිණුම හර 900
ආයෝජන ආදායම් ගිණුම බැර 900

(3). අවිනිශ්චිත ගිණුම හර 13000
ආයෝජන ආදායම් ගිණුම බැර 13000

(4). අවිනිශ්චිත ගිණුම හර 12100
ආයෝජන ආදායම් ගිණුම බැර 12100

(5). අවිනිශ්චිත ගිණුම හර 900
ආයෝජන ආදායම් ගිණුම බැර 900 (......)

9. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයහිමි උප ලෙජරයෙන් උපුටාගත් පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

රු (000)

| සැපයුම්කරුගේ නම | 2021.04.01 දිනට ශේෂය | ණයට ගැනුම් | දඩ පොලි | මුදල් ගෙවීම් | 2022.03.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| A | 500 | 1200 | 200 | 400 | 1500 |
| B | 100 | 800 | - | 300 | 600 |
| C | 150 | 500 | 50 | 300 | 400 |
| | 750 | 2500 | 250 | 1000 | 2500 |

2022.03.31 දිනට ණයහිමි පාලන ගිණුම් ශේෂය සමඟ මෙම ශේෂ එකග නොවීය. පහත වැරදි හඳුනා ගන්නා ලදි.

- ණයට ගැනුම් ණයහිමි පාලන ගිණුමේ රු 5 200ක් පිටපත් කර ඇත.
- C ගේ දඩ පොලී ණයහිමි පාලන ගිණුමේ වැරදි පැත්තේ පිටපත් කර ඇත.
- B ට මුදල් ගෙවීම් අදාළ උපයෝගි පොතේ ලියා නැති අතර B ගේ ගිණුමේ නිවැරදි ව සටහන් කර තිබුණි.

ණයහිමි පාලන ගිණුම නිවැරදි කිරීමට පෙර සහ නිවැරදි කිරීමෙන් පසු ශේෂය වන්නේ,

| | **නිවැරදි කිරීමට පෙර(රු)** | **නිවැරදි කිරීමෙන් පසු(රු)** |
|---|---|---|
| (1). | 2500 බැර | 2500 බැර |
| (2). | 400 හර | 5400 බැර |
| (3). | 2500 බැර | 5400 බැර |
| (4). | 5400 බැර | 2500 බැර |
| (5). | 400 බැර | 2500 බැර |

(......)

10. කල්බදු දේපළ හා සම්මුති බැඳීම් මත ඇතිවන ප්‍රතිපාදන වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීමට අදාළ සංකල්පය වන්නේ,

| | **කල්බදු** | **ප්‍රතිපාදන වගකීම්** |
|---|---|---|
| (1). | යථානුරූපි | ආරක්ෂණ |
| (2). | ඓතිහාසික පිරිවැය | ආරක්ෂණ |
| (3). | යථානුරූපි | යථානුරූපි |
| (4). | ඓතිහාසික පිරිවැය | යථානුරූපි |
| (5). | ආරක්ෂණ සංකල්පය | යථානුරූපි |

(......)

- ප්‍රශ්න අංක **11 හා 12** ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කර ගන්න.

සීමිත රුසිනි පොදු සමාගමේ පහත තොරතුරු ලබා දී ඇත.

2019-10-01 දින සමාගම රක්ෂණ ගිවිසුමට එළඹුනු අතර එහි වාර්ෂික රක්ෂණ වාරිකය රු 240 000 කි. මෙම මුදල ගිවිසුම පටන් ගන්නා දිනයේ ම වර්ෂය සඳහා ම ගෙවිය යුතු ය. රටේ ඇති වූ උද්ධමන තත්ත්වය නිසා 2021-10-01 දින සිට රක්ෂණයේ වාර්ෂික වාරිකය රු 360 000කට වැඩි වී ඇත.

ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට ලබා දුන් අතර මාස 10ක ගොඩනැගිලි කුලී මුදලින් ලැබී ඇති මුත් 2022-03-31 දිනෙන් අවසන් වර්ෂයේ මාස දෙකකට අදාළ කුලිය රු 120 000ක් මුදලින් ලැබී නැත.

11. 2022-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනා ගත යුතු ගොඩනැගිලි කුලී ආදායම සහ රක්ෂණ වියදම වන්නේ,

| | ගොඩනැගිලි කුලී ආදායම | රක්ෂණ වියදම |
|---|---|---|
| (1). | 720 000 | 420 000 |
| (2). | 720 000 | 300 000 |
| (3). | 420 000 | 300 000 |
| (4). | 600 000 | 360 000 |
| (5). | 420 000 | 480 000 |

(......)

12. මෙම සමාගමේ රක්ෂණ වියදම හා ගොඩනැගිලි කුලී ආදායම් ගැළපීම නිසා මුදල්වලට සිදු වූ ශුද්ධ බලපෑම හා හිමිකමට සිදු වූ ශුද්ධ බලපෑම වන්නේ,

| | **හිමිකම ( රු 000)** | **මුදල් (රු 000)** |
|---|---|---|
| (1). | 420 කින් අඩු වේ | 60කින් අඩු වේ |
| (2). | 60 කින් වැඩි වේ | 600කින් වැඩි වේ |
| (3). | 60 කින් අඩු වේ | 420 කින් වැඩි වේ |
| (4). | 420 කින් වැඩි වේ | 240 කින් වැඩි වේ |
| (5). | 180 කින් වැඩි වේ | 60කින් අඩු වේ |

(......)

13. පහත සඳහන් ප්‍රකාශවලින් වත්කමක ලක්ෂණ ඇතුළත් ප්‍රකාශය වන්නේ,

A. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම
B. ව්‍යාපාර පරිපාලනයට යටත් විය යුතු වීම
C. අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා දිය යුතු ය
D. වර්තමාන ආර්ථික සම්පතක් විය යුතු ය

(1). ඉහත සියල්ලමය
(2). A B හා C පමණි
(3). A C හා D පමණි
(4). A හා C පමණි
(5). A B හා D පමණි

(......)

14. මහරගම අරුණලු පුණ්‍යායතනයේ වත්කම් වගකීම් පහත පරිදි වේ

| | 2022-03-31(රු 000) | 2021-03-31(රු 000) |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් | 10 | 30 |
| කලින් ලද සාමාජික මුදල් | 70 | 50 |
| දිගු කාලීන බැංකු ණය | 700 | 850 |
| දේපළ පිරියත උපකරණ (ධාරණ අගය) | 900 | 1000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 100 | 120 |

2022-03-31 දිනෙන් අවසන් වර්ෂයේ අතිරික්තය හෝ හිඟය හා 2022-03-31 දිනට සමුච්චිත අරමුදල වන්නේ,

| | අතිරික්තය(රු) | සමුච්චිත අරමුදල (රු) |
|---|---|---|
| (1). | 10 000 අතිරික්තය | 250 000 |
| (2). | 40 000 අතිරික්තය | 230 000 |
| (3). | 40 000 අතිරික්තය | 190 000 |
| (4). | 10 000 ඌනතාවය | 240 000 |
| (5). | 40 000 ඌනතාවය | 230 000 |

(......)

15. 2022-3-31 අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන කටයුතු සමග වෙළඳාම සිදුකරන සීමිත කුමුදු සමාගමේ පහත ශේෂ ඔබ වෙත දී ඇත.

| | |
|---|---|
| විකුණුම් පිරිවැය | රු 500 000 |
| නොනිමි තොග අඩු වීම | රු 60 000 |
| නිමි තොග වැඩි වීම | රු 100 000 |
| නිෂ්පාදන පොදු කාර්යය | රු 240 000 |

ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පිරිවැය වන්නේ,

| | ප්‍රාථමික පිරිවැය (රු) | නිෂ්පාදන පිරිවැය (රු) |
|---|---|---|
| (1). | 200 000 | 500 000 |
| (2). | 300 000 | 600 000 |
| (3). | 300 000 | 500 000 |
| (4). | 360 000 | 400 000 |
| (5). | 400 000 | 400 000 |

(......)

16. 2022-03-31 න් අවසන් වර්ෂය සඳහා තොග ලේඛනයෙන් උපුටා ගත් පහත තොරතුරු ඔබ වෙත දී ඇත. පෙර පිවිසි පෙර පිට ක්‍රමයට(FIFO) ගබඩා ලෙජරය පවත්වා ගෙන යයි.

| දිනය | විස්තරය | ඒකක | පිරිවැය | වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 2022-03-01 | ශේෂය | 100 | | 10 000 |
| 2022-03-10 | ගැනුම් | 150 | | 30 000 |
| 2022-03-25 | විකුණුම් | 250 | | 25 000 |
| 2022-03-31 | ගැනුම් | 160 | | 32 000 |
| 2022-03-31 | විකුණුම් | 250 | | 75 000 |

2022-03-31 දිනට තොගයේ පිරිවැය හා දළ ලාභය වන්නේ,

| | **ඉතිරි තොගයේ වටිනාකම (රු)** | **දළ ලාභය (රු)** |
|---|---|---|
| (1). | 16 000 | 56 000 |
| (2). | 25 000 | 44 000 |
| (3). | 16 000 | 44 000 |
| (4). | 25 600 | 56 000 |
| (5). | 16 000 | 25 000 |

(......)

17. 2022-03-31 දිනට හා 2021-03-31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දී ඇත.

| | 2022-03-31(රු 000) | 2021-03-31 (රු 000) |
|---|---|---|
| බැංකු ණය | 1000 | 700 |
| දේපළ පිරියත උපකරණ | 1500 | 1200 |

**අතිරේක තොරතුරු**

- 2022-03-31 න් අවසන් වසර තුළ බැංකු ණය ආපසු ගෙවීම රු. 150,000ක් වූ අතර බැංකු ණය ලබා ගැනීම ද සිදු කර ඇත.
- රු. 250,000 ක් පිරිවැය වූ උපකරණයක් රු. 50,000 ක ලාභයක් සහිතව විකුණා ඇත. උපකරණ විකිණීමෙන් රු.200,000 ක් මුදලින් ලබා ගෙන ඇති අතර දේපළ උපකරණ මිල දී ගැනීම රු.500,000කි.

  2022-03-31 දිනෙන් අවසන් වසර සඳහා ලබා ගත් බැංකු ණය හා වාර්ෂික ක්ෂය වටිනාකම වන්නේ,

| | **බැංකු ණය (රු)** | **වාර්ෂික ක්ෂය (රු)** |
|---|---|---|
| (1). | 300 000 | 10 000 |
| (2). | 450 000 | 10 000 |
| (3). | 450 000 | 50 000 |
| (4). | 300 000 | 50 000 |
| (5). | 450 000 | 15 000 |

(......)

18. 2022-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපාරයක ඇති යන්ත්‍ර 02 ක් සම්බන්ධයෙන් තොරතුරු පහත දී ඇත.

1. 2021-4-1 දිනට යන්ත්‍ර ගිණුමේ ශේෂය රු. 1 500 000කි. එදිනට ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 520 000කි.
2. 2019-04-01 දින මිලට ගත් පිරිවැය රු. 850 000ක් වූ යන්ත්‍රය 2021-04-01 දින කළ සමාලෝචනයෙන් එම යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 5 සිට වසර 8 දක්වා වැඩි වී ඇත.
3. 2021-04-01 දිනට තිබූ අනික් යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 10ක් ලෙස හා සුන්බුන් අගය රු.50 000 ක් තිබූ අතර නැවත සමාලෝචනයෙන් එහි කිසිඳු වෙනසක් සිදු නොවීය.

2022-3-31 න් අවසන් වර්ෂය සඳහා සමාලෝචනය කරන ලද යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය හා 2022-03-31 දිනට යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය වන්නේ,

| | වාර්ෂික ක්ෂය ප්‍රමාණය (රු) | 22-03-31 දිනට යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය(රු) |
|---|---|---|
| (1). | 60 000 | 580 000 |
| (2). | 85 000 | 665 000 |
| (3). | 145 000 | 665 000 |
| (4). | 60 000 | 665 000 |
| (5). | 85 000 | 605 000 |

(......)

19. 2022-03-31 න් අවසන් වර්ෂය සඳහා සිත කඳුරට පොදු සමාගමෙන් උපුටා ගත් මූල්‍ය ප්‍රකාශන 2022-09-25 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කොට ප්‍රකාශයට පත් කරන ලදි. මෙම කාලය තුළ සමාගම සම්බන්ධයෙන් පහත සිද්ධීන් ඇති විය.

A. 2022-5-25 දින පිරිවැය රු. 30 000 ක් වටිනා (2022-03-31 දිනට තිබූ) තොග සොරකම් කර ඇත
B. 2022-03-31 දිනට සිටි ණය ගැතියන්ගෙන් රු. 50 000ක් වටිනා ණයගැතියකු බුන්වත් බව දැනුම් දෙන ලදි.
C. 2022-03-31 දිනට තිබූ ව්‍යාපාර ආයෝජන 20% පහළ ගොස් ඇති බව 2022-07-02 දින හඳුනා ගෙන තිබුණි.
D. 2022-02-28 දින ඇති වූ ගංවතුර හේතුවෙන් විනාශ වූ තොගයේ පිරිවැය රු. 65 000ක් බව 2022-07-02 දින හඳුනා ගෙන තිබුණි.

ඉහත සිදුවීම්වලින් නොගැළපෙන සිදුවීම් වන්නේ,

(1). A හා B පමණි
(2). A ,B C පමණි
(3). A B C හා D පමණි
(4). A හා C පමණි
(5). A හා D පමණි

(......)

20. 2022-03-31න් අවසන්වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වගකීම් සහතික වියදම රු.120 000කි. 2021-04-01 දිනට වගකීම් සහතික ප්‍රතිපාදන ශේෂය රු. 150 000 කි. වගකීම් සහතික සඳහා වසර තුළ සිදු කළ අලුත්වැඩියා වියදම රු. 20 000ක් වන්නේ නම් 2022-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු වගකීම් සහතික ප්‍රතිපාදනය වන්නේ,

(1). රු 270 000

(2). රු 50 000

(3). රු 250 000

(4). රු 290 000

(5). රු 10 000

(......)

21. සීමිත ශශි ව්‍යාපාරයේ 2022 මාර්තු මාසයේ වැටුප් ලේඛනයේ තොරතුරු පහත පරිදි වේ.

- සේවක දළ වැටුප මත සේවකයා 10% ක් ද සේවායා 15% ක් ද සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක වේ.
- සේවක දළ වැටුප මත සේවක භාරකාර අරමුදල් දායකය 5% කි.
- මාසික සුභසාධනය රු. 49 500 ක් වැටුපෙන් අඩු කර ඇත.
- ශුද්ධ වැටුප රු. 382 500 කි. වැටුප් ඇතුළු සියලු අඩු කීරීම් ඊළඟ මස 10 වන දින ගෙවනු ලැබේ.

2022 මාර්තු මාසයට අදාළ මුළු ශ්‍රම පිරිවැය හා මුළු වගකීම වන්නේ,

| | **ශ්‍රම පිරිවැය (රු)** | **මුළු වගකීම (රු)** |
|---|---|---|
| (1). | 576 000 | 576 000 |
| (2). | 576 000 | 526 500 |
| (3). | 552 000 | 127 500 |
| (4). | 510 000 | 510 000 |
| (5). | 480 000 | 127 500 |

(......)

- ප්‍රශ්න අංක **22 හා 23** ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න. සීමිත බලංකා සමාගමේ ආසන්නතම ගිණුම් වර්ෂ දෙකක තොරතුරු මෙසේ ය.

| | 2022-03-31 දිනට (රු 000) | 2021-03-31 දිනට (රු 000) |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 50 000 | 45 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 5 000 | 2 000 |
| රඳවාගත් ඉපයුම් | 9 500 | 7 000 |

- 2022-03-31 දිනෙන් අවසන් වර්ෂයේ දී රු. 500 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදි.
- වසර තුළ කොටසක් රු 50 බැගින් කොටස් 80 000ක් ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් සිදු කර ඇත.
- වසර තුළ රඳවා ගත් ඉපයුම් භාවිත කර සංචිත ප්‍රාග්ධනීකරණය සිදු කර ඇත.

22. මුළු විස්තීර්ණ ආදායම හා කාලච්ඡේදයේ ලාභය වන්නේ,

| මුළු විස්තීර්ණ ආදායම | (රු.000)කාලච්ඡේදයේ ලාභය (රු. 000) |
|---|---|
| (1).5 500 | 2 500 |
| (2).6 500 | 4 000 |
| (3).7 000 | 3 500 |
| (4).5 500 | 3 500 |
| (5).7 000 | 4 000 |

(......)

23. මුළු හිමිකමේ හා ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම

| මුළු හිමිකම (රු) | ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම (රු) |
|---|---|
| (1).8 000 | 4 000 |
| (2).10 500 | 5 000 |
| (3).2 000 | 1 000 |
| (4).4 000 | 1 000 |
| (5).10 500 | 4 000 |

(......)

24. දිනුලි සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ අලාභය රු550 000 කි. පහත අතිරේක තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන අලාභය | රු 150 000කි |
| ඉඩම් ප්‍රත්‍යාගණන ලාභය | රු 500 000කි |
| තොග කපා හැරීම | රු 15 000කි |
| මෝටර් රථ විකුණුම් ලාභය | රු 20 000කි |
| මුදල් හැර ජංගම වත්කම් වල ශුද්ධ වැඩිවීම | රු 450 000කි |
| ජංගම වගකීම්වල ශුද්ධ වැඩිවීම | රු 235 000කි |

- කාලච්ඡේදයේ පොලී වියදම රු. 15,000 කි මුදලින් ගෙවා ඇත්තේ රු. 10,000ක් පමණි.
- දිනුලි සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හඳුනා ගන්නා මෙහෙයුම් කටයුතුවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වන්නේ,

(1).රු 640 000

(2).රු 615 000

(3).රු 630 000

(4).රු 1 130 000

(5).රු 1 140 000

(......)

25. 2022-03-31 දිනට සමාගම කාලච්ඡේදයේ ලාභය ගණනය කිරීමේ දී පහත අඩුපාඩු සිදු වී ඇති බව අනාවරණය කර ගෙන ඇත.

- වර්ෂයට අදාළ පොලිය රු. 20,000ක් වැඩියෙන් ගිණුම් තබා ඇත.
- සේව්‍ය EPF දායකත්වය රු. 10,000ක් සම්පූර්ණයෙන් ම මග හැරී ඇත.
- ආදායම් බදු රු. 2,000ක් වැඩිපුර ගෙවා ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු වර්ෂයේ ලාභයට හා පොලී ආවරණ අනුපාතයට වන බලපෑම වන්නේ

| | ලාභය | පොලී ආවරණ අනුපාතය |
|---|---|---|
| (1). | වැඩි වේ | අඩු වේ |
| (2). | වැඩි වේ | වෙනස් නොවේ |
| (3). | වෙනස් නොවේ | අඩු වේ |
| (4). | වැඩි වේ | වැඩි වේ |
| (5). | අඩු වේ | අඩු වේ |

(......)

26. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) සම්බන්ධයෙන් උපකල්පනයක් නොවන්නේ

(1). වාර්ෂික තොග පරිභෝජනය නියත වශයෙන් දන්නා බව

(2). තොග ඇණවුම් කරන ප්‍රමාණය එකවර නොලැබෙන බව

(3). තොග පවත්වා ගෙන යාමේ පිරිවැය නිශ්චිත ව දන්නා බව

(4). අවම තොග මට්ටම ශුන්‍යයක පවතින බව

(5). තොග ඒකකයක මිල නිශ්චිත බව (......)

27. ක්‍රියාකාරී කාලය හඳුනා ගැනීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛන කට්ටලය ඇතුළත් වන්නේ,

(1). අත්සන් ලේඛන, අක්‍රිය කාල පත්‍රිකා, කාර්යය තුණ්ඩුව, වේලා සටහන් පත්‍රය

(2). ඇඟිලි සලකුණු යන්ත්‍රය, කාර්යය පිරිවැය පත්‍රිකාව, කාල පත්‍රිකාව, අක්‍රිය කාල පත්‍රිකාව

(3). කාල පත්‍ර, කාර්යය තුණ්ඩුව, කාර්යය පිරිවැය පත්‍රිකාව, අක්‍රිය කාල පත්‍රිකාව

(4). විශේෂ සංඥා සහිත කාඩ්පත් ,ඇඟිලි සලකුණු යන්ත්‍රය ,අත්සන් ලේඛන, වේලා සටහන් පත්‍රය,

(5). වේලා සටහන් පත්‍රය, කාල පත්‍රිකාව, කාර්යය තුණ්ඩුව, අක්‍රිය කාල පත්‍රිකාව (......)

28. තොගයේ පිරිවැය නිශ්චය කිරීමේ දී පිරිවැය වර්ගීකරණයේ පදනම හා පිරිවැය වර්ග වන්නේ,

| | පදනම | වර්ගීකරණය |
|---|---|---|
| (1). | හැසිරීම | ප්‍රාථමික හා පොදු කාර්යය |
| (2). | ස්වභාවය | ස්ථාවර හා විචල්‍ය |
| (3). | හැසිරීම | ස්ථාවර හා විචල්‍ය |
| (4). | පාලනය | පාලනය කළ හැකි හා නොහැකි |
| (5). | ස්වභාවය | ඍජු හා වක්‍ර |

(......)

29. ජයනාත් සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර විකුණයි. පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

| | |
|---|---|
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු 225 |
| ලාභ පරිමා අනුපාතය | 25% |
| සමච්ඡේදනයේ දී මුළු දායකය | රු 75 000 |
| වර්තමාන විකුණුම් ආදායම | රු 420 000 |

සමච්ඡේදන විකුණුම් ඒකක සංඛ්‍යාව හා ආරක්ෂිත ආන්තිකය වන්නේ,

| | සමච්ඡේදන ඒකක සංඛ්‍යාව ඒකක | ආරක්ෂිත ආන්තිකය (රු) |
|---|---|---|
| (1). | 1000 | 300 000 |
| (2). | 1400 | 420 000 |
| (3). | 1000 | 420 000 |
| (4). | 1400 | 120 000 |
| (5). | 1000 | 120 000 |

(......)

30. ප්‍රාග්ධන ආයෝජන ඇගයීම් ක්‍රමයේ දී පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

A. ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ARR) ගණනය කිරීමේ දී මුළු ආදායම හා මුළු වියදම සැලකිල්ලට ගනී.

B. පිළිගෙවුම් කාල ක්‍රමයේ (PBP) ව්‍යාපෘතියේ මුළු මුදල් ලැබීම් හා මුළු මුදල් ගෙවීම් යොදා ගනී.

C. ශුද්ධ වර්තමාන අගය ක්‍රමයේ දී මුළු මුදල් ප්‍රවාහය කෙරෙහි අවධානය යොමු කරයි.

D. ප්‍රාග්ධන ආයෝජන ඇගයීම් ශිල්ප ක්‍රමයක් ලෙස ශුද්ධ වර්තමාන වටිනාකම් හොඳ ක්‍රමයක් ලෙස පිළි නොගනී.

(1). A , B හා D පමණි
(2). A , B හා C පමණි
(3). A හා C පමණි
(4). A හා D පමණි
(5). ඉහත සියල්ලම (......)

31. ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් ලබා දී ඇති පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න වරහන් තුළ දක්වන්න.

(1). සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන මූලිකාංග ඓතිහාසික පිරිවැය පදනම මත හා ප්‍රවර්තන අගය පදනම මත පමණක් මිනුම්කරණය කරයි. (      )

(2). මූල්‍ය ප්‍රකාශන තොරතුරු බාහිර පාර්ශව පමණක් භාවිත කරයි. (      )

(3). මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ලෙස ශේෂ පිරික්සුම හඳුනා ගනියි. (      )

(4). මූල්‍ය මිනුම්කරණ සංකල්පයේ සීමා මග හරවා ගැනීම සඳහා මානව සම්පත් ගිණුම්කරණය නව ප්‍රවණතා ලෙස හඳුන්වා දී ඇත. (      )

32. 2022-03-31 දිනට ව්‍යාපාරයක ගනුදෙනු ගැළපීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය පහත දී ඇත.

| **වත්කම්** | **= ප්‍රාග්ධනය** | **+ රඳවාගත් ඉපයුම්** | **+ වගකීම්** |
|---|---|---|---|
| (රු 000) | (රු 000) | (රු 000) | (රු 000) |
| 1500 | = 1000 | + 300 | + 200 |

ඉහත සමීකරණය ගණනය කිරීමේ දී පහත අඩුපාඩු සිදු වී ඇත.

- වසර තුළ අයිතිකරු විසින් රු. 30,000ක වෙළඳ ණයහිමියන් 10%ක වට්ටමකට යටත් ව පියවා ඇත. එය ගිණුම් තබා නැත.
- 15% වැට් සහිත විකුණුම් මිල රු. 230,000ක් වැට් නොසලකා සම්පූර්ණ වටිනාකම ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු පහත අයිතමයන්ගේ වටිනාකම්

(1). වගකීම් රු ................

(2). ප්‍රාග්ධනය රු ................

(3). රඳවාගත් ඉපයුම් රු ................

33. ව්‍යාපාරයක පහත ගනුදෙනු ගිණුම් තැබීමට අදාළ ව යොදා ගෙන ඇති ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1). දේපළ පිරියත හා උපකරණ ඒවායේ ගත් මිල මත පොත්වල දැක්වීම ................

(2). විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී තොග ගැනිලි අඩු කිරීම ................

(3). වගකීම් සහතික ප්‍රතිපාදන ජංගම වගකීම් ලෙස දැක්වීම ...............

(4). රඳවාගත් ඉපයුම් හිමිකමේ කොටසක් ලෙස හඳුනා ගනී ................

34. 2022-03-31 අවසන් මාසය සඳහා ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් තොරතුරු පහත වේ.

| | |
|---|---|
| විකුණුම් | රු 345 000 |
| ගැනුම් | රු 172 500 |
| ගෙවූ VAT | රු 12 500 |
| VAT පාලන ගිණුම 2022-03-01 දිනට | රු 15 000 (හර) |

**අතිරේක තොරතුරු**

- සියලු ගැනුම් සහ විකුණුම් 15% වැට් සහිත වේ.
- මාසය තුළ ආපසු එවුම් 14 000 ( VAT ගණනය කළ යුතු ය)

(1). 2022-3-31 දිනට හඳුනා ගත යුතු VAT වටිනාකම කීය ද? ..... ....

(2). එය 2022-3-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගත යුත්තේ වත්කමක් ලෙසට ද වගකීමක් ලෙසට ද ..... ....

35. 2022/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයකට අදාළ ව පහත තොරතුරු දී ඇත.

| | (රු 000) |
|---|---|
| සෘජු ශ්‍රමය | 150 |
| ආරම්භක අමුද්‍රව්‍ය තොගය | 250 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 1500 |
| ගෙන ඒමේ කුලී | 70 |
| ස්ථාවර පොදුකාර්ය පිරිවැය | 500 |
| විචල්‍ය පොදුකාර්ය පිරිවැය | 300 |

**අතිරේක තොරතුරු**

- ඒකකයක් නිෂ්පාදනයට පැය 2ක් ගතවේ. සෘජු ශ්‍රම පැයක් සඳහා රු 100ක් ගෙවනු ලැබේ.
- 2022-03-31 දිනට අමුද්‍රව්‍ය තොගය රු180 000
- වසර තුළ අමුද්‍රව්‍ය සොරකම් කිරිම රු 20 000
- නිෂ්පාදනය කළ මුළු ඒකක ගණන 1 000
- සියලු පොදුකාර්යවලින් 20%ක් පරිපාලනයට අදාළ වේ.

(1). 2022-03-31 අවසන් වර්ෂයේ නිෂ්පාදන පිරිවැය කීය ද? ..........

(2). ඒකකයක ප්‍රාථමික පිරිවැය කීය ද? ................

(3). ඒකකයක විචල්‍ය පිරිවැය කීය ද? ................

36. 2022-03-31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

ණයට විකුණුම් ?

ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම් රු 170 000

15% දුන් වට්ටම්

වසර තුළ ණයගැති ශුද්ධ අඩු වීම රු 20 000

(1). දුන් වට්ටම් ගණනය කරන්න..................

(2). කාලච්ඡේදයේ විකුණුම් ගණනය කරන්න......................

37. ශ්‍රම සුරකුම් ලංකා පදනම ලාභ අරමුණ කර නොගත් සංවිධානකිග 2021-04-01 දිනට පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

සමුච්චිත අරමුදල රු 500 000

යාවජීව සාමාජික මුදල රු 240 000 (2020-04-01 දින ආරම්භ කරන ලදි)

ශ්‍රම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි අරමුදල රු 120 000 (2020-04-01 දින පිහිටුවන ලදි)

**අතිරේක තොරතුරු**

- කාලච්ඡේදයේ වෙනත් ආදායම රු 120 000 ක් වූ අතර කාලච්ඡේදයේ මුළු මෙහෙයුම් වියදම රු 80 000.
- යාවජීව සාමාජික අරමුදල වසර 10 ක් සඳහා පිහිටුවා ඇත.
- ශ්‍රම පුහුණු මධ්‍යස්ථාන 2022-03-01 දින සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ඔබ විසින්,

(1). 2022-03-31 දිනෙන් අවසන් වර්ෂයේ අතිරික්තය හෝ ඌනතාවය ගණනය කරන්න........

(2). 2022-03-31 දිනට මුළු හිමිකම ගණනය කරන්න.............

38. අනුර, භවන්ත සහ කාදර් විසින් 2:2:1 ලෙස ලාභාලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය ව්‍යාපාරයෙන් 2021-04-01 දින අනුර විශ්‍රාම ගන්නා ලදි. ඒ සම්බන්ධව පහත තොරතුරු ඔබ වෙත දී ඇත. ඉතිරි හවුල්කරුවන් සමාන ව ලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යන ලදි.

i. 2021/4/1 දිනට ප්‍රාග්ධනය ගිණුම් ශේෂ

| | |
|---|---|
| අනුර | 200 000 |
| භවන්ත | 500 000 |
| කාදර් | 300 000 |

ii. 2021/4/1 දිනට ජංගම ගිණුම් ශේෂ

| | |
|---|---|
| අනුර | 20 000 |
| භවන්ත | (10 000) |
| කාදර් | ( 5 000) |

iii. අනුරගේ හිමිකම සම්පූර්ණයෙන් ම එදින 10% පොලියකට යටත්ව ණය ගිණුමට මාරු කරන ලදි. 2022-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔහුගේ ණය පොලිය රු 32 000කි.

A. අනුර ඉවත් වූ දිනයේ තක්සේරු කළ ව්‍යාපාර කීර්තිනාමය කිය ද?..........

B. 2022-03-31 දිනට කාදර්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කිය ද?...........

C. 2022-03-31 දිනට භවන්ත ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කිය ද?.............

39. සීමිත මිලිදු සමාගම පහත කොන්දේසි යටතේ යන්ත්‍ර 05ක් සීමිත පාල සමාගමට විකිණීමට 2022-01-01 යෝජනා ඉදිරිපත් කර ඇත,

| | |
|---|---|
| යන්ත්‍රයක විකුණුම් මිල | රු 250 000 |
| යන්ත්‍ර සවිකිරීම | රු 50 000 |

වසර 02 ක සේවා කාලය රු 100 000 ( සවිකල දින සිට සේවා කාලය ආරම්භ වේ)

යන්ත්‍ර සවිකිරීම ව්‍යාපාරය විසින් කළ යුතු අතර වසර 02 සේවා කාලය ලබා ගැනීම අනිවාර්යය නොවේ. සියලු අවශ්‍යතා එකවර ඉටු කර ගන්නේ නම් 20% වෙළඳ වට්ටම් හිමි වේ. 2022-01-01 සියලු අවශ්‍යතා සඳහා යෝජනාව අත්සන් තබන ලදි. 22-02-01- යන්ත්‍ර 05 ලබා දුන් අතර සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව වූ රු1280 000ක් මුදලින් ලැබුණි. 2022-03-31 වන විට ඉන් යන්ත්‍ර 03ක් සවි කිරීම අවසන් කරන ලදි.

2022-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,

(1). හඳුනාගත යුතු මුළු අයභාර ආදායම.............

(2). එදිනට හඳුනාගත යුතු නොඉපයූ අයභාර ආදායම ගණනය කරන්න...... ....

40. සී/ස ප්‍රභාත් පොදු සමාගම රු 350 000 ක සාධාරණ අගයකට 2021-04-01 දින කල්බදු පහසුකම් යටතේ වසර 04 ක කාලපරිච්ඡේදයක් සඳහා යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදි.

වාර්ෂික කල්බදු වාරිකය රු 150 000 ක් වූ අතර පළමු කල් බදු වාරිකය 2022-03-31 ක දින ගෙවා ඇත, කල්බදු ගිවිසුමට එළෙඹෙන අවස්ථාවේ දී සෘජු වියදම් ලෙස රු 50 000ක් දරා තිබුණ ද එය මෙතෙක් ගිණුම් ගත කර නැත,

2021/2022 ප්‍රවර්තන වර්ෂයේ පොළිය රු 60 000 ක් හා 2022/2023 වර්ෂයේ පොළිය රු 70 000 ක් විය.

A. කල්බදු ණයහිමියන්ගේ ජංගම හා ජංගම නොවන වගකීම කොපමණ ද?................

B. මෙසේ කල්බදු ණයහිමියාව ජංගම හා ජංගම නොවන ලෙස හඳුනා ගැනීමට පාදක වන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?..................

41. සීමිත දසුන් සමාගමේ 2021-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | රු 000 |
|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (100 000 කොටස්) | 4 500 |
| පොදු සංචිතය | 2 000 |

2021-10-01 දින සමාගම සාමාන්‍ය කොටස් 5 කට 1 ක් වන ලෙස කොටසක් රු 60 ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් සිදුකරන ලදි. මේ සඳහා සියලු ම කොටස්කරුවන් හිමිකම් කොටස් ලබාගත් අතර 2021-10-01 දිනට පැවැති කොටස් ප්‍රමාණයෙන් 1/4 ක ප්‍රසාද කොටස් නිකුතුවක් සිදු කර ඇත්තේ රු.50 ක ප්‍රතිෂ්ඨාවකට යටත්ව ය.

2022-03-31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය දක්වන්න ...... .... ..... .... ..... .... ..... .... ..... .... ..... ....

42. සී/ස නුවන් පොදු සමාගම රු 400 000 ක් වටිනා දේපළ පිරියත උපකරණ 2021-04-01 දින රු 50,000ක අතිරික්තයක් ඇතිව ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කර ඇත. සමාගම දේපළ පිරියත උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර ප්‍රත්‍යාගණන අගය පොත්වලට ගනු ලැබුවේ නම් කාලච්ඡේදයේ ලාභයට හා මුළු විස්තීර්ණ ආදායමට වූ ශුද්ධ බලපෑම කොපමණ ද?..... .... ..... .... ..... ....

43. වසර තුළ දේපළ පිරියත උපකරණ ශුද්ධ වැඩි වීම රු 150 000 ක් වූ අතර වාර්ෂික ක්ෂය රු 30 000 කි. රු 120 000 ක් පිරිවැය වූ හා රු 20 000ක් ක්ෂය වෙන්කරන ලද යන්ත්‍රයක් රු 25 000ක ලාභයක් සහිතව විකුණා ඇත. (මිල දී ගැනීම හා විකිණීම අත්පිට මුදලට සිදුකර ඇත).

i වසර තුළ මිලට ගත් දේපළ පිරියත කීය ද?..... .... ..... .... ..... ....

ii විකුණු දේපළ සඳහා ලද මුදල කීය ද?..... .... ..... .... ..... ....

44. 2022-03-31 දිනට කව්දුගේ ව්‍යාපාරයේ ඉතිරි තොගය රු 20 000 ක් වූ අතර පහත අනුපාත ගණනය කළ පසු රු 5 000 ක ණයහිමි පියවීමක් ගිණුම්ගත කර නොමැති බව අනාවරණය විය.

| | |
|---|---|
| ජංගම අනුපාතය | 3:1 |
| ක්ෂණික අනුපාතය | 2:1 |


1) 22-3-31 දිනට නිවැරදි කිරීමට පෙර තිබූ ජංගම වත්කම් කීය ද? ..............................

2) ඉහත ගනුදෙනු නිවැරදි කළ පසු ගණනය කළ පහත අනුපාතයන් ට කුමක් සිදු වේ ද? (අඩුවේ/වැඩිවේ/වෙනස් නොවේ)

i. ජංගම අනුපාතය ..... .... ..... ....

ii. ක්ෂණික අනුපාතය ..... .... ..... ....

45.




i.ඒකක 150 දී මුළු දායකය කොපමණ ද?..... .... ..... .... ..... ....

ii.ඒකක 220 ක් විකිණිමට අපේක්ෂා කරයි නම් අපේක්ෂිත ලාභය කොපමණ ද?..... .... ..... .... ..... ..

46. නිෂ්පාදන අයිතමයක් මිල දී ගන්නා වෙළෙන්දෙකුට A නැමැති අයිතමය සඳහා ඒකක 300 000 ක වාර්ෂික ඉල්ලුමක් පවතී. එක් ඇණවුමක් සඳහා රු 60 ක් වැය වන අතර තොග තබා ගැනීමේ පිරිවැය තොග පිරිවැයෙන් 10% කි. භාණ්ඩ ඒකකයක පිරිවැය රු 40 කි.

(1). ආර්ථික ඇණවුම් ප්‍රමාණය කොපමණ ද?..... .... ..... .... ..... ....

(2). ප්‍රශස්ත ඇණවුම් සංඛ්‍යාව කොපමණ ද?..... .... ..... .... ..... ....

47. බේකරිරි කර්මාන්තයේ නියුතු පිටි අනන්නෙකුට පැයකට රු 300ක් ගෙවනු ලබන අතර සෑම අතිකාල පැයකටම රු 400ක් ගෙවනු ලැබේ. සතියකට දින 5ක් වැඩ කළ යුතු ය. සාමාන්‍ය වැඩ කරන පැය 08 කි. 2022 ජනවාරි මස පළමු සතිය තුළ පිටි අනන්නා පැය 50 ක් වැඩ කර ඇත.

පහත දෑ ගණනය කරන්න

(1). ජනවාරි මස පළමු සතිය තුළ පිටි අනන්නාගේ මුළු වේතනය.... ..... .... ..... ....

(2). පිටි අනන්නාගේ වේතනය තුළ ඇතුළත් සෘජු ශ්‍රම පිරිවැය .... ..... .... ..... ....

48. පහත තොරතුරු සමාගමක් විසින් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.

| | ඒකකයක පිරිවැය (රු.) |
|---|---|
| මුළු පිරිවැය | 400 |
| සෘජු පිරිවැය | 90 |
| නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 150 |

සියලු සෘජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ. තව ද නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයෙන් 30%ක් හා නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැයෙන් 10%ක් විචල්‍ය පිරිවැය වේ.

i. ඒකකයක නිෂ්පාදන පිරිවැය රු .... ..... .... ..... ....

ii. ඒකකයක මුළු විචල්‍ය පිරිවැය රු .... ..... .... ..... ....

49. සමාජ සංවිධානයක් විසින් කොවිඩ් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන අතර ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමට සිංහ සමාජය එකඟ වී තිබේ. මෙම වැඩසටහනට සහභාගිවන්නකු වෙනුවෙන් රු 3 000ක් පිරිවැයක් දැරීමට සමාජ සංවිධානයට සිදුවන අතර සහභාගි වන පුද්ගලයින් වෙනුවෙන් රු 4 000ක් සමාජ සංවිධානයට ගෙවීමට සිංහ සමාජය එකගත්වය පළකර ඇත.

ඇස්තමේන්තු ගත වියදම පහත දැක්වේ.

| | රු |
|---|---|
| දේශක ගාස්තු | 25 000 |
| ශාලාව සඳහා | 60 000 |
| දැනුවත් කිරීමේ පත්‍රිකා | 10 000 |
| සංග්‍රහ සඳහා දේශකයාට | 5 000 |

පහත දෑ ගණනය කරන්න

(1). එක් සහභාගි වන්නකු මත දායකයක?.... ..... .... ..... ....

(2). දැනුවත් කිරීමේ වැඩසටහන් ස්ථාවර පිරිවැය?.... ..... .... ..... ....

(3). මුළු පිරිවැය ආවරණය සඳහා සහභාගි විය යුතු පුද්ගලයින් සංඛ්‍යාව.... ..... .... ..... ....

50. සමාගමක් නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා පවතින විකල්ප ව්‍යාපෘතීන් හා ඒවායේ ශුද්ධ වර්තමාන අගය හා පිළිගෙවුම් කාලය පහත පරිදි වේ

| **ව්‍යාපෘතිය** | **ශුද්ධ වර්තමාන අගය** | **පිළිගෙවුම් කාලය** |
|---|---|---|
| K | 200 000 | අවු 3 මාස 8 |
| L | 178 000 | අවු 3 මාස 6 |
| M | (25 000) | අවු 4 මාස 2 |
| N | 0 | අවු 5 |

(1). සමාගම ශුද්ධ වර්තමාන අගය මත තෝරාගත යුත්තේ කුමන ව්‍යාපෘතිය ද? හේතු දක්වන්න
.... ..... .... ..... .... .... ..... .... ..... ....

(2). පිළි ගෙවුම් කාල ක්‍රමය මත තෝරාගත යුත්තේ කුමන ව්‍යාපෘතිය ද? හේතු දක්වන්න
.... ..... .... ....... .... ..... .... ..... ....

අ.පො.ස. උසස් පෙළ

# ගිණුම්කරණය II

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය - 2022**

**ගිණුම්කරණය II** **කාලයː පැය තුනයි**

විභාග අංකය :...................................

උපදෙස්ː

- **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට **ලකුණු** 200 ක් හිමි වේ.

(01). සීමිත "ලක්නක" පොදු සමාගමේ 2022.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

(රු.000)

| **විස්තරය** | **හර** | **බැර** |
|---|---|---|
| දේපළ පිරියත උපකරණ පිරිවැයට | 13 000 | |
| කල්බදු වියදම් | 1 000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ/ වෙළඳ ගෙවිය යුතු දෑ | 4 500 | 3 200 |
| ගෙවූ ණය පොළී | 200 | |
| ගැනුම් | 3 500 | |
| පරිත්‍යාග | 300 | |
| ගෙවූ බදු | 900 | |
| පරිපාලන වියදම් | 3 000 | |
| බෙදාහැරීමේ වියදම් | 1 200 | |
| ලාභාංශ ගෙවීම් | 700 | |
| 10% ආයෝජන | 5 000 | |
| භාණ්ඩාගාර බිල්පත් - 2021.04.01 අත්පත් කරගත් | 2 000 | |
| තොගය | 920 | |
| මුදල් | 454 | |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 830 | 134 |
| විකුණුම් | | 19 620 |
| වගකීම් සහතික සඳහා වෙන්කිරීම්(2021.04.01 දිනට) | | 400 |
| ඉඩම් ප්‍රත්‍යාගනණ සංචිත | | 800 |
| දේපළ පිරියත උපකරණ සමුච්චිත ක්ෂය (2021.04.01) | | 2 800 |
| හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම (2021.04.01) | | 250 |
| 12% බැංකු ණය | | 2 000 |
| 2021.04.01 දිනට බදු වෙන්කිරීම | | 400 |
| විකුණුම් අත්තිකාරම් | | 400 |
| ආයෝජන ආදායම් | | 200 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 5 700 |
| රඳවාගත් ඉපයුම් | | 1 600 |
| | 37 504 | 37 504 |

**අතිරේක තොරතුරු-**

1. 2022.03.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු.500 000 ක් වන අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු.550 000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. අධ්‍යක්ෂකවරුන් මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීමට ප්‍රථම 2022.05.15 දින රු.80 000ක විකුණුම් වියදම් දරා තොගය රු.560 000කට අලෙවිකරණ ලදි.

2. ශේෂ පිරික්සුම තුළ දැක්වෙන පරිපාලන වියදම් තුළ පහත අයිතම ඇතුළත් වේ. (රු.000)

| | |
|---|---|
| විගණන ගාස්තු | 250 |
| කල්බදු වාරිකය | 800 |
| වගකීම් සහතික මත අලුත්වැඩියා වියදම් | 100 |
| ප්‍රචාරණය | 120 |

3. 2021.10.01 දින ධාරණ අගය රු.600 000ක් වු පරිගණකයක් රු.20 000ක ලාභයක් සහිතව විකිණීමෙන් ලද මුදල පරිගණක ගිණුමට බැර කිරීම හැර වෙනත් සටහනක් තබා නැත. මෙම වත්කම 2019.10.01 දින මිලට ගෙන ඇත.

4. වර්තමාන විකුණුම් මත රු. 320 000 වගකීම් සහතික ප්‍රතිපාදනයක් ප්‍රවර්තන වර්ෂයට සිදුකළ යුතුය. වසර තුළ දී වගකීම් සහතික වියදම් ලෙස සිදු කරන ලද රු 100 000ක අලුත්වැඩියා වියදම ඉහත පරිපාලන වියදම් තුළ අන්තර්ගත කර ඇත.

5. පහත තොරතුරු ව්‍යාපාරයේ දේපළ පිරියත හා උපකරණ හා බැදේ. (රු.000)

| විස්තරය | පිරිවැය/ ප්‍රත්‍යාගණන | සමුච්චිත ක්ෂය 2021.04.01 දිනට | ක්ෂය ප්‍රතිශතය |
|---|---|---|---|
| ඉඩම් | 5 000 | - | - |
| ගොඩනැගිලි | 4 000 | 1 200 | 5% |
| පරිගණක | 3 000 | 1 400 | 20% |
| යන්ත්‍ර | 1 000 | 200 | 10% |
| | 13 000 | 2 800 | |

2021.10.01 දින මිලට ගත් පිරිවැය රු. 200 000 ක යන්ත්‍රය ද ඉහත යන්ත්‍ර පිරිවැය යටතේ දක්වා ඇත.

6. වසර අග දී ඉඩම රු4 000 000කට නැවත ප්‍රත්‍යාගණනයක් සිදු කරන ලදි. 2022.03.31 දින ව්‍යාපාරයේ පැවති ගොඩනැගිල්ල රු.2 800 000කට ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයක් සිදු කර ඇත. මෙම ගනුදෙනුවට අදාළ කිසිදු සටහනක් පොත්වල වාර්තාකර නැත.

7. 2021.04.01 දින ව්‍යාපාරය කල්බදු පදනම යටතේ බෙදාහැරීමේ කාර්යය සඳහා මෝටර් රථයක් අත්පත්කර ගන්නා ලදි. ඒ පිළිබඳ විස්තර මෙසේ ය. (රු.000)

| | |
|---|---|
| කල්බදු ගෙවීම්වල වර්තමාන අගය | 2500 |
| මූලික තැන්පතුව | 800 |
| ලියාපදිංචි ගාස්තුව | 200 |
| ඵලදායී ජීව කාලය වසර | 7 |
| සුන්බුන් අගයක් නැත | |

වාර්ෂික කල්බදු වාරිකය රු.800 000 ක් වන අතර කල්බදු කාලය වසර 5කි. පළමු හා දෙවන වසරේ පොළිය පිළිවෙළින් රු.500 000ක් හා රු.400 000ක් වේ. කල්බදු මූලික තැන්පතුව හා ලියාපදිංචි ගාස්තුව කල්බදු වියදම් ලෙස ශේෂ පිරික්සුමේ දක්වා ඇත. වෙනත් කිසිදු සටහනක් තබා නැත. වසරේ කල්බදු වාරිකය ගෙවා ඇත.

8. 2022.02.28 දින සහන කොන්දේසි යටතේ භාණ්ඩ විකිණීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරණ ලදි

| | |
|---|---|
| භාණ්ඩ විකුණුම් හි වටිනාකම | රු. 600 000 |
| වසරක සේවා සැපයුම | රු. 200 000 |

2022.03.31 දින යෝජනාව අනුමත කර එදිනට ඉහත භාණ්ඩ විකුණුම්වලින් 50% ක් ගනුදෙනුකරු වෙත ලබා දී ඇත. ලබා දුන් දින සිට වසරක සේවා සැපයුම් කාලයක් ලබා දීම ගිවිසුමට අනුව සිදු වේ. භාණ්ඩ බාරදුන් දිනයේ දී රු. 400 000ක මුදලක් ලබා දී ඇත. එය විකුණුම් අත්තිකාරම් ලෙස දක්වා ඇත.

9. වසර අවසානයේ වෙළඳ ලැබිය යුතු දෑ තුළ අන්තර්ගත රු.200 000ක් වටිනා ණයගැතියන් බුන්වත් බව 2022.05.02 දින අධිකරණය තීන්දු කරන ලදි. මෙම ණයගැතියන් ගෙන් රු 50 000ක් වටිනා ණයගැතියන් ශේෂ පිරික්සුමේ ඇති හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමට මේ වන විට හඳුනා ගෙන ඇත. ඉතිරි ණයගැති ශේෂයෙන් 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමක් සිදු කළ යුතු ය.

10. වර්ෂයේ ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් 20%ක් ලෙස ගත යුතු ය. ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති ගෙවූ බදු වටිනාකම තුළ ඉකුත් වර්ෂය වෙනුවෙන් එකඟ වූ රු.450 000 ක බද්ද ද ඇතුළත් වේ.

11. වසර අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත යෝජනා ඉදිරිපත් කර ඇත.
   - රඳවාගත් ඉපයුම්වලින් රු.500 000ක් පොදු සංචිතයට මාරු කර පොදු සංචිතයක් ඇති කිරීම
   - රු.300 000ක රදවාගත් ඉපැයුම් භාවිත කර සංචිත ප්‍රාග්ධනිත කිරීම
   - සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට රු.10 බැගින් අවසාන ලාභාංශයක් යෝජනා කිරීම



ජාතික අධ්‍යාපන ආයතනය Channel NIE

**අවශ්‍ය වන්නේ,**

LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත "ලක්නක" පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය
3. 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(මුළු ලකුණු 40)

(02). (අ) සීමිත සන්රේ පොදු සමාගම AB නමැති භාණ්ඩය නිෂ්පාදනය සඳහා "X" නම් අමුද්‍රව්‍ය භාවිත කරයි. AB භාණ්ඩයේ සතියක නිෂ්පාදනය ඒකක 200 සිට 400 දක්වා විචලනය වන අතර එක් ඒකකයක් නිෂ්පාදනය සඳහා "X" අමුද්‍රව්‍ය 10kgක් අවශ්‍යවේ.

| | | |
|---|---|---|
| පොරොත්තු කාලය | - | අවම 4 |
| සති | | උපරිම 6 |
| උපරිම තොග මට්ටම | - | ඒකක 30 000 |

**අවශ්‍යවන්නේ,**

(1). අමුද්‍රව්‍ය "X" සඳහා යළි ඇණවුම් මට්ටම

(2). අමුද්‍රව්‍ය "X" සඳහා යළි ඇණවුම් ප්‍රමාණය

(3). අමුද්‍රව්‍ය "X" සඳහා සාමාන්‍ය තොග මට්ටම ගණනය කරන්න.

(ලකුණු 10)

(ආ) වින්දි ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ සේවකයන්ට ගෙවන ලද වැටුප් පිළිබඳ තොරතුරු පහත වේ.

| | | |
|---|---|---|
| පරිපාලන නිලධාරී | - ඕහාසි | 170 000 |
| සංවර්ධන නිලධාරී | - නිසිනි | 127 500 |
| කළමනාකරණ සහකාර | - කිරුළි | 85 000 |

**අතිරේක තොරතුරු**

i ජනවාරි මාසයේ ඉහත සේවකයන්ට වැටුප් ගෙවා ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලට EPF දායකය දළ වැටුපෙන් 10%ක් හා සේවක රක්ෂණ භාරක මාසික දායකය දළ වැටුපෙන් 5%ක් අඩු කිරීමෙන් පසුව ය.

ii වින්දි සමාගම සේවක අර්ථසාධක අරමුදලට EPF දළ වැටුපෙන් 15%ක දායකත්වයක් දක්වන අතර සේවා නියුක්තික භාර අරමුදලට ETF 3%ක දායකත්වයක් දක්වයි.

iii සෑම මසකම EPF, ETF හා රක්ෂණ දායක මුදල් ඊට පසු මාසයේ 15 වන දින ගෙවනු ලබයි. 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු EPF ගිණුමේ රු. 112 500ක ශේෂයක්, ගෙවිය යුතු ETF ගිණුමේ රු. 10 000ක ශේෂයක් හා ගෙවිය යුතු සේවක රක්ෂණ වාරික ගිණුමේ රු. 22 500ක ශේෂයක් තිබුණි. මෙම මුදල් ජනවාරි 15 දින මුදලින් ගෙවන ලදි.

**අවශ්‍ය වන්නේ,**

(1). 2022 ජනවාරි මාසය සඳහා වැටුප් ලේඛනය

(2). වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු EPF, ගෙවිය යුතු ETF හා ගෙවිය යුතු රක්ෂණ වාරික ගිණුම (ලකුණු 10)

(ඉ) සීමිත පවන් නිෂ්පාදන සමාගම කුඩ සහ කාන්තා අත්බෑග් නිෂ්පාදනය කරයි. ඒ සඳහා නිෂ්පාදන දෙපාර්තමේන්තු 2ක් හා සේවා දෙපාර්තමේන්තුවක් (ආපනශාලාව) ඇත. නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක ම පිහිටා ඇත්තේ එකම ගොඩනැගිල්ලක ය. (ගොඩනැගිලි 1) සේවා දෙපාර්තමේන්තුව වෙනත් ගොඩනැගිල්ලක පිහිටා ඇත. (ගොඩනැගිලි 2) සේවා දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර භාවිත නොකරයි.

ඇස්තමේන්තුගත පොදු කාර්ය වියදම් පහත පරිදි වේ.

| | රු.000 |
|---|---|
| විදුලි වියදම් (ආලෝකය) | 2 000 |
| විදුලි වියදම් (යන්ත්‍ර ධාවනය) | 600 |
| යන්ත්‍ර ක්ෂය | 300 |
| ආපනශාලා වියදම් (ආහාර) | 250 |
| ගොඩනැගිලි කුලී (ගොඩනැගිලි 1) | 240 |
| (ගොඩනැගිලි 2) | 100 |
| සේවක වැටුප් | 400 |
| නිෂ්පාදන කළමනාකරු වැටුප් | 500 |
| ආපනශාලා පාලක වැටුප් | 300 |

**අතිරේක තොරතුරු**

| අයිතමය | නිෂ්පාදන 1 | නිෂ්පාදන 2 | සේවා |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය | 2 000 | 1 000 | - |
| සේවක සංඛ්‍යාව | 30 | 10 | 10 |
| බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 5 000 | 3 000 | 2 000 |
| නිෂ්පාදන කළමනාකරුවන් සංඛ්‍යාව | 3 | 2 | - |

- සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය සමානව නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදිය යුතු ය.
- නිෂ්පාදන දෙපාර්තමේන්තු පොදුකාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනම මත අන්තර්ග්‍රහණය කරයි. නිෂ්පාදන1 හා නිෂ්පාදන 2 දෙපාර්තමේන්තුවල වාර්ෂික ඇස්තමෙන්තුගත යන්ත්‍ර පැය ගණන පිළිවෙළින් 10 000ක් සහ 5 000ක් වේ.
- ඇස්තමේන්තුගත ඒකකයක පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | කුඩ | කාන්තා අත් බෑග් |
|---|---|---|
| ප්‍රාථමික පිරිවැය රු. | 800 | 2 000 |
| යන්ත්‍ර පැය - නිෂ්පාදන 1 | 2 | 3 |
| නිෂ්පාදන 2 | 1 | 2 |
| විකුණුම් මත ලාභාන්තිකය | 25% | 20% |

**අවශ්‍යවන්නේ,**

(1). විභජන පදනම දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2). සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය සුදුසු පදනම යොදා ගනිමින් නැවත විභජනය

(3). එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(4). විකුණුම් මිල මත 25%ක ලාභාන්තිකයක් පවත්වා ගන්නේ නම් කුඩයක විකුණුම් මිල

(ලකුණු 20)

(03). කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා සෙනුරි "ඇග්‍රෝ" නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් 2022.04.01 දින ආරම්භ කරන ලදි. 2022 අප්‍රේල් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

i ව්‍යාපාරය අයිතිකරු රු: 500 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ද, රු: 300 000 මුදලක් ව්‍යාපාරය නමින් වූ බැංකු ජංගම ගිණුමක තැන්පත් කරමින් ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදි.

ii රු: 200 000 ක් වටිනා පොහොර තොගයක් හරි අඩක් මුදලින් ගෙවා ඉතිරිය ණය පදනම මත මිලදී ගන්නා ලදි.

iii පිරිවැයට 20% ක ලාභ ප්‍රතිශතයක් සහිත ව රු:30 000ක් පිරිවැය වූ තොග අත්පිට මුදලට විකුණා ඇත.

iv පොහොර ගබඩා කර තබා ගැනීම සඳහා රු: 60 000ක් වටිනා උපකරණ තොගයක් අයිතිකරු විසින් ව්‍යාපාරයට යොදවන ලදි.

v රු: 50 000ක වෙළඳ ගෙවිය යුතු දේ පියවීම සඳහා රුපියල් 20,000 තොග ආපසු යැවූ අතර ඉතිරිය අයිතිකරු තම පෞද්ගලික මුදලින් පියවන ලදි.

vi කල් ඉකුත් වීම හේතුවෙන් පිරිවැය රු: 20 000ක් වූ තොගයක් සැපයුම්කරුට ආපසු යවන ලදි.

vii පිරිවැය රු: 25 000ක තොගයක් රු: 30 000කට ණයට විකුණා ඇති අතර ඇණවුම සමඟ නොගැළපීම නිසා ඉන් පිරිවැය රු:5 000ක් වූ තොගයක් ආපසු එවන ලදී.

viii ව්‍යාපාරික ගොඩනැගිල්ලේ මාසික විදුලි බිල වූ රු. 5 000ක් ගෙවිය යුතුව ඇත. මාසික ගොඩනැගිලි ක්ෂය රු.2 000කි.

ix අයිතිකරු තම ගෙවත්තේ වගා සඳහා ගෙන ගිය පොහොර තොගයේ වටිනාකම රු 6 000 කි.

x සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල 10% ක වට්ටමකට යටත්ව පියවන ලදි.

2022.04.30 දිනට ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු දෑ ගණනය කිරීමේ දී පහත තොරතුරු සැලකිල්ලට ගෙන නොමැත.

- බැංකු ප්‍රකාශනයට අනුව රු.5 000ක් සෘජු ප්‍රේෂණ ලෙස ලැබී ඇත.
- රු. 3 000ක් ගනුදෙනුකරුවන් බොල් ණය ලෙස හඳුනාගෙන ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. අංක 01 සිට අංක 10 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම අගයන් සහිත ව ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත ආකෘතිය භාවිත කරන්න.

| | දේපළ පිරියත උපකරණ | තොගය | වෙළඳ ලබිය යුතු දෑ | මුදල් | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයුම් |
|---|---|---|---|---|---|---|---|---|
| i | | | | | | | | |

2. 2022 අප්‍රේල් මාසය සඳහා සංශෝධිත වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය ගණනය කරන්න.
3. 2020 අප්‍රේල් මාසය සඳහා ශුද්ධ වත්කම් පදනම් කර ගෙන ලාභය/අලාභය ගණනය කරන්න.

(ලකුණු 40)

(04). (අ) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සීමාසහිත අවිදූ (පෞද්ගලික) සමාගම බිත්තර අලෙවි කිරීමේ ව්‍යාපාරයක නිරතව ඇත. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර 2022.01.01 දිනට පහත ශේෂ ලෙජරයෙන් උපුටා ගන්නා ලදි.

| | රු(000) |
|---|---|
| මුදල් | 400 |
| වෙළඳ ණයගැතියෝ | 200 |
| වෙළඳ ණයහිමියෝ | 300 |
| වැට් පාලන ගිණුම (බැර) | 50 |

ඉහත වෙළඳ ණයගැති ශේෂ පියවීම සඳහා 2022.01.20 දින මුදල් ලැබුණි. 2022.01.31 දින සමාගම විසින් ඉහත ගෙවිය යුතු ණය හිමි හා වැට් ශේෂ පියවන ලදි.

පහත තොරතුරු 2002 ජනවාරි මාසය සඳහා අදාළ වේ.

<u>**විකුණුම් හා වෙළඳ ණය ගැතියෝ**</u>

සමාගම තොග වෙළඳුන් සඳහා දින 30ක ණය කාලසීමාවක් සහිතව බිත්තර ණයට විකුණනු ලබයි. මුළු මුදල දින 15ක් තුළ පියවන්නේ නම් VAT රහිත විකුණුම් වටිනාකම මත 10% ක වට්ටමක් දෙනු ලබයි. 2022.01.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් ජර්නලයෙන් උපුටා ගන්නා ලද තොරතුරු පහත වේ.

| | විකුණුම් (රු 000) | VAT 8% (රු 000) |
|---|---|---|
| අමිල | 800 | 64 |
| බණ්ඩාර | 600 | 48 |
| ක්‍රිෂාන් | 400 | 32 |
| | 1 800 | 144 |

අමිල මුළු ණය මුදල හා බණ්ඩාර ණය මුදලින් හරි අඩක් දින 15ක් ඇතුළත පියවීම කළ අතර ක්‍රිෂාන් රුපියල් 200 000ක් පමණක් නියමිත ණය කාල සීමාව තුළ ගෙවා ඇත.

මෙම සමාගම තමන්ගේ අලෙවිහල මගින් සිල්ලර වෙළඳුන් සඳහා තොග අත්පිට මුදලට විකිණීම සිදු කරන අතර මාසය සඳහා අත්පිට විකුණුම් 8%ක් වූ VAT සහිතව රු. 216 000ක් විය.

**<u>ගැනුම් හා වෙළඳ ණය හිමියෝ</u>**

සමාගම ප්‍රනාන්දු සහ පුත්‍රයින්ගෙන් ණය පදනම මත බිත්තර තොග ලබාගන්නා අතර අනිකුත් සැපයුම්කරුවන්ගෙන් අත්පිට මුදලට බිත්තර මිලට ගනියි. ප්‍රනාන්දු සහ පුත්‍රයින්ගෙන් ණයට ගැනුම් VAT රහිතව රු 500 000ක් විය.

ප්‍රනාන්දු සමාගමට ගෙවිය යුතු රු 400 000ක ශේෂයක් පියවීම සඳහා 10%ක වට්ටමකට යටත්ව ගෙවන ලදි. අනිකුත් සැපයුම්කරුවන්ගෙන් කළ අත්පිට ගැනුම් රු 300 000 මෙම ගැනුම් සඳහා VAT අදාළ නොවේ.

**<u>වියදම් සහ අමතර ආදායම්</u>**

මාසය තුළ දී ගෙවන ලද මෙහෙයුම් වියදම් රු 150 000ක් විය. බිත්තර තොග ප්‍රවාහනය කිරීම සඳහා රු 50 000ක මුදලක් බිත්තර තොග වෙළඳුන්ගෙන් ලබා ගෙන ඇත.

මෙහෙයුම් වියදම් සහ වෙනත් ආදායම් සඳහා VAT අදාළ නොවේ.

**අවශ්‍ය වන්නේ,**

1. ලැබීම් හා ගෙවීම් ජ'නලය
2. පහත ලෙජර ගිණුම්
   - මුදල් පාලන ගිණුම
   - ණයගැති පාලන ගිණුම
   - ණයහිමි පාලන ගිණුම
   - වැට් පාලන ගිණුම

(ලකුණු 20)

(ආ) කසුනි සහ ලුතාරා පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුම්ගත කොන්දේසි පහත පරිදිවේ.

- ලාභාලාභ සම සමව බෙදා ගැනීම
- සෑම හවුල්කරුවෙකුට ම මාසිකව රු 15 000ක වේතනයක් ගෙවීම
- ප්‍රාග්ධනය සඳහා 10%ක වාර්ෂික පොලියකට හිමිකම් ලැබීම
- හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන ණය මුදල් මෙන් ම හවුල් ව්‍යාපාරය හවුල්කරුවන්ට ලබාදුන් ණය සඳහා ද 8%ක පොලියක් ගැළපිය යුතු ය.
- කීර්තිනාමය සම්බන්ධ සියලු ම ගැළපුම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් කළ යුතු වේ.

2022.03.31 දිනට කසුනි සහ ලුතාරා හවුල් ව්‍යාපාරයේ සාරාංශගත ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | රු 000 | රු 000 |
|---|---|---|
| දේපල පිරියත උපකරණ | 3 500 | |
| විකුණුම් | | 4 000 |
| විකුණුම් පිරිවැය | 2 000 | |
| මෙහෙයුම් වියදම් | 800 | |
| සේවක ණය 8% - සෙනුති | | 1 000 |
| ප්‍රාග්ධන ගිනුම් - කසුනි | | 1 200 |
| ලුතාරා | | 1 500 |
| ජංගම ගිණුම් - කසුනි | 200 | |
| ලුතාරා | | 300 |
| කසුනිට ලබාදුන් ණය | 800 | |
| මුදල් | 200 | |
| ගැනිලි - කසුනි | 200 | |
| ලුතාරා | 300 | |
| | 8 000 | 8 000 |

**අතිරේක තොරතුරු**

i ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක ලුතාරා පදිංචි වී සිටින අතර ඒ සඳහා මසකට රු 20,000ක කුලියක් ව්‍යාපාරයට ගෙවිය යුතු ය. මේ පිළිබඳව කිසිම සටහනක් පොත්වල තබා නැත.

ii සෙනුති හා කසුනිගේ ණය සඳහා පොලිය ගළපා නොමැත.

iii ව්‍යාපාරයේ විදුලි වියදම රු 300 000ක් කසුනි තම පෞද්ගලික මුදලින් ගෙවා ඇත. එය කසුනිට මෙතෙක් ප්‍රතිපූර්ණය කර නොමැති අතර ගිණුම් පොත්වල සටහන්ව නැත.

iv ලුතාරා ව්‍යාපාරයෙන් සිදු කළ භාණ්ඩ ගැනිලි රු.100 000 පිළිබඳව පොත්වල කිසිදු සටහනක් තබා නොමැත.

v ව්‍යාපාරයේ සේවකයකු ලෙස කටයුතු කළ සෙනුති 2022.03.31 දින නව හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට ඇතුළත් වූ අතර ඇය ව්‍යාපාරයට ලබා දී ඇති ණය මුදල ප්‍රාග්ධනය ලෙස සැලකීමටත් ඇයගේ කීර්තිනාම කොටස සඳහා රු 200 000ක මුදලක් රැගෙන ඒමටත් ඇය එකඟතාවය පළ කරන ලදි

vi නව හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ අනුපාතය 5 : 3 : 2 ලෙස පිළිවෙළින් කසුනි ලුතාරා හා සෙනුති අතර බෙදා ගනී.

**අවශ්‍යවන්නේ,**

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය විසර්ජනය ද සහිත ව
2. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම

(ලකුණු 20)

(05). (අ) සීමිත සිතංගි පොදු සමාගමේ 2022.03.31 දිනට සහ 2021.03.31 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දැක්වේ.

| **විස්තරය** | 2022.03.31 දිනට (රු 000) | 2021.03.31 දි (රු 000) |
|---|---|---|
| දේපළ පිරියත උපකරණ ධාරණ අගය | 35 000 | 33 000 |
| ස්ථාවර තැන්පතු | 5 000 | - |
| තොගය | 8 200 | 6 500 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 9 500 | 12 400 |
| ඉදිරියට ගෙවූ වියදම් | 1 400 | 1 200 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලි | 300 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 400 | 1 800 |
| **මුළු වත්කම්** | 61 800 | 54 900 |
| | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 30 000 | 25 000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 5 000 | 3 000 |
| රදවාගත් ඉපයුම් | 5 300 | 2 400 |
| බැංකු ණය | 13 000 | 14 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 5 900 | 8 100 |
| උපචිත පොලිය | 1 200 | 800 |
| ආදායම් බදු ප්‍රතිපාදන | 1 400 | 1 600 |
| **මුළු හිමිකම් හා වගකීම්** | 61 800 | 54 900 |

**අතිරේක තොරතුරු**

1. සියලු ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු කරයි.
2. වසර තුළ දේපළ පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇති අතර මිලට ගත් මෝටර් රථයේ පිරිවැය රු 1 200 000කි.
3. වසර තුළ පිරිවැය රු 300 000 ක් වටිනා කාර්යාල උපකරණයක් රු 20 000ක ලාභයක් සහිතව විකුණන ලදි. විකුණන අවස්ථාවේ සමුච්චිත ක්ෂය රු 30 000.
4. වසර තුළ බැංකු ණය ලබාගෙන ඇති අතර ගෙවන ලද බැංකු ණය වාරිකය රු 1 700 000 යි. මෙහි ඇතුළත් පොලිය රු 200 000කි
5. ස්ථාවර තැන්පතු 2021.07.01 දින 10% පොලියට ආයෝජන කර ඇත.
6. ගෙවූ බදු රු 1 500 000කි.

**අවශ්‍යවන්නේ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතියට අනුව 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සිතංගි පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.(මෙහෙයුම් ක්‍රියාකාරකම් වක්‍ර ක්‍රමයට දැක්වෙන පරිදි)

(ලකුණු 20)

(ආ) රන්මුතු ක්‍රීඩා සමාජයේ 2020.03.31 දිනට සිටි සාමාජිකයන් ගණන 150 කි.

2021.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම හා වත්කම් වගකීම් පහත දී ඇත.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ ගේ ශේෂය | 150 000 | ක්‍රීඩාගාර කුලිය | 80 000 |
| සාමාජික මුදල් | 200 000 | ක්‍රීඩා උපකරණ | 30 000 |
| පරිත්‍යාග | 10 000 | වෙනත් වියදම් | 40 000 |
| අබලි ද්‍රව්‍ය විකුණුම් | 15 000 | ස්ථාවර තැන්පතු | 100 000 |
| | | ප ගේ ශේෂය | 125 000 |
| | 375 000 | | 375 000 |
| ඉ ගේ ශේෂය | 125 000 | | |



ජාතික අධ්‍යාපන ආයතනය Channel NIE

2020.03.31 වත්කම් වගකීම්

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 500 000 |
| ක්‍රීඩා උපකරණ | 200 000 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 10 000 |
| කලින් ලද සාමාජික මුදල් | 5 000 |
| අතැති මුදල් | 125 000 |
| ගෙවිය යුතු ක්‍රීඩාගාර කුලිය | 12 000 |
| කලින් ගෙවූ වෙනත් වියදම් | 7 000 |

පහත තොරතුරු ඔබට දී ඇත

i  වර්ෂයට අදාළ ගොඩනැගිලි ක්ෂය රු 8 000 කි

ii  2021.03.31 දිනට කලින් ලද හා ලැබිය යුතු සාමාජික මුදල් පිළිවෙළින් රු 20 000 ක් හා රු 40 000 ක් විය

iii  2021.03.31 දිනට උපචිත ක්‍රීඩාගාර කුලිය රු 5 000 ක් වූ අතර ඉදිරියට ගෙවූ වෙනත් වියදම් රු 4 000 කි

iv  ක්‍රීඩා උපකරණ වාර්ෂිකව 5% බැගින් ක්ෂය කරයි

**අවශ්‍ය වන්නේ,**

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම
2. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(ලකුණු 20)

(06). (අ) ප්‍රබුද්ධ පොදු සමාගමේ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

| | |
|---|---|
| විකුණුම් (ණයට සිදු වී ඇත) | 4 500 000 |
| දළ ලාභ අනුපාතය | 30% |
| ආරම්භක දිනට තොගය | 20 000 |
| වර්ෂය තුළ තොගවල ශුද්ධ වැඩිවීම | 140 000 |
| වෙනත් ආදායම් | 550 000 |
| මුළු විකුණුම් ආදායමෙන් 20%ක් (පොලීය හැර) මෙහෙයුම් වියදම් වේ. | |
| කාලච්ඡේදයේ බදු | 30 000 |
| දිගු කාලීන ණය (10% බැංකු ණය) | 1 000 000 |
| වැඩ කළ දින ගණන | 240 |

කාලච්ඡේදයේ ණයට විකුණුම්වලින් 20%ක් සාමාන්‍ය ණයගැතියන් ලෙස හඳුනාගනී.

**අවශ්‍ය වන්නේ,**

පහත එක් එක් තත්ත්වයන් මත තීරණ ගැනීම සඳහා සුදුසු අනුපාතය ගණනය කරන්න.

1. තොග භාවිතයේ කාර්යක්ෂමතාවය සෙවීම
2. ණයගැතියන්ගෙන් මුදල් එකතු කිරීමට ගත කරනු ලබන කාලය
3. ණය මත පොලී ගෙවීමට ඇති හැකියාව

(ලකුණු 10)

(ආ) සීමිත සදිල් සමාගම එම සමාගමේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සැලසුම් කරමින් සිටී. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත.

i නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය රු. 500 000කට විකිණිය හැකිය.

ii නව යන්ත්‍රයට අදාළ තොරතුරු

| | |
|---|---|
| පිරිවැය | 3 800 000 |
| ඵලදායී ජීව කාලය | වර්ෂ 5යි |
| සුන්බුන් අගය | 800 000 |

iii පළමු හා දෙවන වසරේ වාර්ෂික නඩත්තු පිරිවැය රු. 500 000 බැගින් වන අතර තුන්වන වසරේ සිට එය රු. 100 000 බැගින් වේ.

iv වාර්ෂික ස්ථාවර පිරිවැය ක්ෂය ඇතුළුව රු. 750 000කි.

v නව යන්ත්‍රය මිල දී ගැනීම නිසා වාර්ෂික ශ්‍රම පිරිවැයෙහි ඉතිරිය රු 950 000කි.

vi 12% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධකය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| 0.89 | 0.79 | 0.71 | 0.64 | 0.57 |

**අවශ්‍ය වන්නේ,**

ඉහත ව්‍යාපෘතියට අදාළ ව,

1. එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම්
2. පිළිගෙවුම් කාලය
3. ශුද්ධ වර්තමාන අගය හා නිර්දේශය

(ලකුණු 10)

(ඉ) සීමිත මෙත්සාදි සමාගම පාසල් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන හා අලෙවි සමාගමකි. මේ දිනවල රටේ පවතින බඩු මිල ඉහළ යාම් හා ගෘහස්ථ බිල්පත් ඉහළ යාම පිළිබඳ දැනුවත් කිරීම් හා ඊට විසඳුම් සෙවීම් සම්බන්ධ පැය 5ක වැඩමුළුවක් ආයතනයේ සුභ සාධක සංගමය සංවිධානය කරමින් සිටී.

මේ සඳහා සමාගමේ අභ්‍යන්තර සේවකයන් හා බාහිර පුද්ගලයන්ට ද සහභාගී විය හැකිය. වැඩමුළුවට සහභාගී වන්නන්ගෙන් රු. 2 000ක ගාස්තුවක් අයකරනු ලැබේ.

මේ සඳහා පහත වියදම් ඇස්තමේන්තු ලබා දී ඇත.

- දේශකයෙක් සඳහා පැයකට රු. 2 500 (දේශකයන් දෙදෙනයි.)
- උපදෙස් අඩංගු පත්‍රිකා මුද්‍රණ වියදම රු. 200 (එක් පත්‍රිකාවක් සඳහා)
- ශාලා කුලී පැයකට රු.4 000
- ශබ්ද විකාශන යන්ත්‍ර කුලී රු. 14 000
- එක් අයෙකුට සංග්‍රහ වියදම රු. 500
- සමාගමේ සුභ සාධක සමිතියෙන් මෙම වියදම් ආවරණය කර ගැනීම සඳහා රු. 20 000ක මුදලක් ලබා දෙයි.
- උපරිම වශයෙන් ශාලා පහසුකම් ලබා දිය හැක්කේ පුද්ගලයන් 100ක් සඳහා පමණි.

**අවශ්‍ය වන්නේ,**

1. මුළු පිරිවැය ආවරණය සඳහා සහභාගි විය යුතු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණ ද?
2. පුද්ගලයන් 65ක් සහභාගි වන්නේ නම් ලාභය කොපමණ ද?
3. සහභාගි වන පුද්ගලයන් 65 දෙනා අතරින් 26 දෙනෙකු සමාගමේ අභ්‍යන්තර සේවකයින් වේ නම්, ඔවුන්ගෙන් ගාස්තු අය නොකරයි නම් හා එහෙත් පොත් පිංචේ ගාස්තු ලබා දෙයි නම් ලාභය කොපමණ ද?
4. අයකරනු ලබන රු. 2 000ක ගාස්තුව අඩු කරන මෙන් සහභාගිවන්නන් ඉල්ලීම් කර ඇත්නම් හා පුද්ගලන් 40 දෙනෙකු සහභාගි වේ නම් මුළු පිරිවැය ආවරණය කර ගැනීමට අය කළ යුතු ගාස්තුව කොපමණ ද?

(ලකුණු 20)